රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2001

මගේ අංකය :- II/309ර්95/22
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් පාලන,
පළාත් සභා සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.10.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ සේවයේ කණිෂ්ඨ ශ්‍රේණීවල තාවකාලික, අනියම් හා ආදේශක සේවකයන් ස්ථිර කිරීම.

2001 ඔක්තෝබර් 01 දිනට දින 180ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, වැඩ හා හැසිරීම සතුටුදායක, කම්කරු ශ්‍රේණීවල, කාර්යාල සේවක සේවයේ සහ රියදුරු සේවයේ තාවකාලික, අනියම් හා ආදේශක සේවකයන්, පහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන්නේ නම් 2001 ඔක්තෝබර් මස 01 දින සිට එම සේවාවන්හි බඳවා ගැනීමේ ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබිය යුතු යයි රජය තීරණය කර ඇත.

I. 2001.10.01 දිනට අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් තිබිය යුතුය.
II. අනුමත සේවක සංඛ්‍යාවේ ස්ථිර තනතුරක අඛණ්ඩව සේවය කර තිබිය යුතුය.
III. අනුමත බඳවා ගැනීම් පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

02. මේ යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සේවකයින්ගේ වයස 2001.10.01 දිනට අවුරුදු 45 ඉක්මවා තිබුනද ඔවුන් ආදේශක, අනියම් හා තාවකාලික ලෙස සේවයට බඳවා ගන්නා අවස්ථාවේ දී වයස අවුරුදු 45 ඉක්මවා නොතිබුනේ නම් ඔවුන් සේවයේ ස්ථිර කළ හැක.

03. ඉහත තීරණය අනුව කටයුතු කිරීමට නොපමාව පියවර ගන්න.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිවය.

එම්..එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන,
පළාත් සභා සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය